**උඩුනුවර ප්‍රාදේශීය සභාව - 2021**

**------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන

------------------

1.1 අහිතකර මතය

-------------------

උඩුනුවර ප්‍රාදේශීය සභාවේ 2021දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාරව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, ඉදිරිපත් කළයුතු මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන්, 2021 දෙසැම්බර් 31 දිනට උඩුනුවර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අහිතකර මතය සඳහා පදනම

----------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අහිතකර මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන්, ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍යප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවයමෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව, විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී,වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද, යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වා ගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii)වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව,ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, මෙම වාර්තාවේ1.6.1 ඡේදයේ(අ) නිරීක්ෂණ හැර, ඉකුත් වර්ෂයේ දී, මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

---------------------------------------------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ වාර්තාවෙන් පෙන්වා දුන් 1.6.1(ඊ) ඡේදයේ සඳහන් රු. 854,950 ක අවිනිශ්චිත ගිණුමේ පැවති බැර ශේෂය නිවැරදි කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරමි | අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ රු.273,025 ක පුනරාවර්තන වියදම් වර්ෂයේ වියදම් හා ණයහිමියන් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | අතපසුවීමකින් ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව දන්වා ඇත | වියදම් හා ණයහිමි ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා දරන ලද රු.1,949,046 ක පිරිවැය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම වටිනාකමින් කොටසක් ගිණුම්ගත කර ඇත | ගොඩනැගිලි ඉදිකිරීම් පිරිවැය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට සත්‍ය වශයෙන් ඇති වී නොතිබුණු ණයහිමියන් රු.455,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | අතරැදි මුදල් වන අතර, ණයගැති හා ණයහිමි යටතේ ප්‍රතිපාදන වෙන් කර ඇත | ණයහිමියන් නිවැරදිව හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.658,800 ක ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සභා තීරණයක් අනුව ඉදිරියේ දි කටයුතු කරමි | ත්‍රී රෝද රථ බලපත්‍ර ගාස්තු ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රදර්ශන පුවරු සඳහා අය විය යුතු රු.672,000 ක ආදායමක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ගිණුම් තැබීම මඟ හැරී ඇති අතර, හිඟ මුදල් අය කර ගන්නා බව දන්වා ඇත | දැන්වීම් පුවරු ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (උ) | සභා අරමුදල් යොදවා ඉටු කිරීමට සැලැසුම් කර තිබුණු රු.1,071,315 ක කර්මාන්ත 07 ක් ඉටු නොකර සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් ලෙසදක්වා තිබුණි. | අවසන් කළ වැඩ සඳහා බිල්පත් ලබා නොදීම, ගිවිසුම් පමණක් සකස් කර තිබීම යන කරුණු මත ණයහිමියන් ලෙස දක්වා ඇත | මූල්‍ය ප්‍රකාශනවල දක්වන ණයහිමි ශේෂය නිවැරදිව හඳුනා ගත යුතුය |

1.6.2 නොසැසඳුනු පාලන ගිණුම් හෝ වාර්තා
--------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයඅවසානයට ගිණුම් විෂයයන් 10 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් ශේෂ හා උපයෝගී ලේඛනවල ශේෂ අතර රු.26,382,375 ක වෙනසක් පැවතුණි. | උපයෝගී ලේඛන පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරමි | වෙනස්කම් සඳහා හේතු හඳුනා ගෙන නිවැරදි අගය ගිණුම්වල ගැලපිය යුතුය |

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම
----------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයඅවසානයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු රු.777,089 ක වත්කම් විෂයයන් 03 ක් භාණ්ඩ සමීක්ෂණ වාර්තාහා අනෙකුත් උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා, විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | ඉදිරියේ දී ලබා දීමට කටයුතු කරමි | ගිණුම් ශේෂ සනාථ කර ගැනීමට අවශ්‍ය උපලේඛන නිවැරදිව පවත්වා ගෙන යා යුතුය |

1.7 අනුකූල නොවීම්
-------------------

1.7.1 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම්
----------------------------------------------------

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | 2015 වර්ෂය තුළ දි අවස්ථා 05 කදී නිලධාරීන්ට ලබා දී තිබුණු රු.89,142 ක අතුරු අග්‍රිම සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද පියවා නොතිබුණි. | අදාළ නිලධාරීන් වෙත ලිඛිතව දැනුම් දී ඇති අතර, අය කර ගැනීමට කටයුතු කරමි | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |

| | | | | |
|---|---|---|---|---|
| (ii) | මුදල් රෙගුලාසි 571 | සමාලෝචිත වර්ෂය අවසානයට කල් ඉකුත් වී පවතින 1994 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා අවස්ථා 142 කදී, තැන්පත් කර තිබුණු රු.743,445 විවිධ තැන්පතු සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නැවත පරීක්ෂා කර මුදල් රෙගුලාසි 571 අනුව කටයුතු කරමි | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය |

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.41,643,798 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,313,313 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
------------------------

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
--------------------------------------

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණපහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් | | |
| | 2011වර්ෂයේසිට2015 වර්ෂයදක්වාකාලපරිච්ඡේදයතුළවරිපනම්ආදායම් එකතු කිරීමේ දී, මූල්‍ය අක්‍රමිකතාවයක් සිදු වී තිබුණු අතර, එම මූල්‍ය අක්‍රමිකතාවයට අදාළව තවදුරටත් ක්ෂේත්‍රය තුළින් කරුණු හෙළිදරව් වී තිබුණි. මෙයට අදාළ මූලික හා අවසන් පරීක්ෂණවල දී රු.1,028,451 ක හිඟ වරිපනම් ශේෂයක් අය කර ගත යුතු බව නිගමනය කර, "අය කර ගත යුතු වරිපනම් වංචා ගිණුම" ලෙස නව ගිණුම් ශේෂයක් 2018 ගිණුම් වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා වසර 04 කට අධික කාලයක් ගත වී තිබුණ ද, මෙම වරිපනම් මුදල් අය කර නොතිබුණු අතර, ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති රු.32,120,181 ක හිඟ හිටි වරිපනම් ශේෂයේ නිවැරදිතාවය පිළිබඳ විගණනයේ දී සෑහීමකට පත් වීමට නොහැකි විය. එමෙන්ම, එම ශේෂය තුළ ඒකකයකහිඟයරු.10,000 ඉක්මවූදේපළ 521 කටඅදාළවඅයවියයුතුරු.8,343,921 ක හිඟ වරිපනම් බදු දඇතුළත්වතිබුණි. | වරිපනම් දත්ත පද්ධතිය හා ගිණුම නිවැරදි කර ඇත | වරිපනම් බදු වංචාව ලෙස සඳහන් මුදල අය කර ගැනීමට හා හිඟ වරිපනම් බදු අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය |

(ආ) වෙනත් ආදායම්

------------------

i. දැන්වීම් පුවරු ගාස්තු

-------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට සභා බල ප්‍රදේශයේ ස්ථාපනය කර තිබුණු දැන්වීම් පුවරු 400 කට අදාළව අය විය යුතු රු.672,000 ක් අය කර නොතිබුණු අතර, එම ශේෂය තුළ එක් පුවරුවක හිඟය රු.10,000 කට වැඩි පුවරු 13 කින් අය විය යුතු රු.198,400 ක් ඇතුළත්ව තිබුණි. | රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය මත ගෙවීම් ප්‍රමාද වී ඇති බව හා කඩිනමින් අය කර ගැනීමට ආදායම් පරීක්ෂකවරු දැනුවත් කර ඇත | හිඟ දැන්වීම් පුවරු ආදායම් අය කර ගත යුතුය |

ii. ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු

-------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට අය විය යුතු රු.658,000 ක ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර නොතිබුණි. | රටේ පැවති වසංගත තත්ත්වය මත ගෙවීම් කිරීම හා අය කිරීම ප්‍රමාද වී ඇත | හිඟ ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු අය කර ගත යුතුය |

2.3 අධිභාර

---------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් ඉකුත් වර්ෂය තුළ දී රු.1,161,311ක අධිභාර 02 ක් පනවා තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් ඉන් රු.1,085,636 ක මුදලක් අය කර ගැනීමට තිබුණි. | අභියාචනා පරීක්ෂණ ප්‍රතිඵල ලැබී නොමැති වීම නිසා අයවීම් ප්‍රමාද බව දන්වා ඇත | අධිභාර සහතික අනුව අදාළ මුදල් අය කර ගත යුතුය |

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

ප්‍රාදේශීය සභා පනතේ 03 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ

-------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ගබඩාවේ රු.361,398 ක නළ ළිං උපාංග විෂයයන් 2,081 ක තොගයක් වසර 04 කට අධික කාලයක් නිෂ්කාර්යයව පැවතුණි. | 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ සඳහා ඉදිරිපත් කර අවශ්‍ය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත | ගබඩා උපාංග ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සේවක ණය | | |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4:2:4 වගන්තිය පරිදි විශ්‍රාමික, වැඩ තහනම් කළ හා මිය ගිය සේවකයින් 10 දෙනෙකුගෙන් අය විය යුතු රු.116,303 ක සේවක ණය වසරකට වැඩි කාලයක සිට අයවීම හිඟ හිට පැවතුණි. | තොරතුරු සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත | සභාවට අය විය යුතු සේවක ණය අය කර ගත යුතුය |
| (ආ) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් සේවකයින් සඳහා වැටුප් ගෙවීම පරීක්ෂාව | | |
| 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත සඳහා 1998 දෙසැම්බර් 31 දින දක්වා සිදු කරන ලද සංශෝධිත ඇතුළත් සංස්ථාපිත ප්‍රකාශනයේ 10(1)(2) වගන්තිය අනුව, හා 1980 අංක 46දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනතේ දෙවන කොටසේ 16(1) වගන්තිය අනුව, 2020 මාර්තු මස සිට 2021 නොවැම්බර් මස දක්වා කාලයට අදාළව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු රු.815,489 ක දායක මුදල් ගෙවා නොතිබුණි. | දෛනික පදනම මත බඳවා ගෙන ඇති බැවින්, දායක මුදල් ගෙවා නොමැති බව හා ඉදිරියේ දි නිවැරදි කිරීමට කටයුතු කරමි | අදාළ පනත් හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් ගෙවිය යුතුය |

3.3 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයඅවසානයට පැවති රු.5,289,600 ක ගර්හිත වාහන 08 ක් වසර 02 කට අධික කාලයක සිට අපහරණය කර නොතිබුණි. | අලුත්වැඩියා හා අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදු වෙමින් පවතින බව | අපහරණය කළ යුතු වාහන අපහරණය කළ යුතුය |